සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st Step, 4 th floor, **Sethsiripaya ,Battaramulla**

මගේ අංකය / எனது இல / My No } DDD/HO/4/LH/Revo
ඔබේ අංකය / உமது இல / Your No } ..................................
දිනය / திகதி / Date } 2017.02.20

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් දිවි නැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් දිවි නැගුම අධ්‍යක්ෂවරුන්.

**ජීවනෝපාය චක්‍රීය අරමුදලින් ජීවනෝපාය ව්‍යාපෘති සඳහා**
**ණය ලබාදීමේ වැඩ සටහන සඳහා වූ නව සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම**

ජීවනෝපාය සංවර්ධන චක්‍රීය ණය වැඩසටහන මේ වනවිට දිවිනැගුම ප්‍රජාමූල බැංකු මට්ටමින් ක්‍රියාත්මක වුවද , මෙමඟින් අපේක්ෂිත අරමුණු කරා ලගාවීමට නොහැකි වී ඇති බවට කරුණු අනාවරණය වී ඇත. එම නිසා සමෘද්ධි හා අඩු ආදායම්ලාභී ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබලගැන්වීම මඟින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමත්, අධික පොලී සහිත අවිධිමත් ණය ක්‍රමයන්ගෙන් (අධික පොලී අනුපාත සහිත ණය ) ප්‍රජාව මුදවා ගැනීම වැනි මූලික අරමුණු පෙරදැරි කර ගනිමින් ජීවනෝපාය චක්‍රීය ණය වැඩසටහන තවදුරටත් ක්‍රමවත් හා යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවයක් මතුව තිබේ.

ඒ අනුව ජීවනෝපාය සංවර්ධන වැඩසටහනට සමගාමීව **“ජීවනෝපාය චක්‍රීය ණය වැඩසටහන “** නව්‍ය ආකාරයට මුල්‍ය පහසුකරණය ලඟා කර දිය හැකි වනසේ පහත සඳහන් සංශෝධනයන් සිදුකර ඇති බව කාරුණිකව දැනුම් දෙමි.

1. ජීවනෝපාය ව්‍යාපාති ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ලබා දෙන රු.75,000/- දක්වා වූ උපරිම ණය මුදල රු.500,000/- දක්වා ඉහළ දැමීම

2. යම්කිසි දිවි නැගුම ප්‍රජාමූල බැංකුවකට ජීවනෝපාය චක්‍රීය අරමුදලේ මුදල් ශේෂය ජීවනෝපාය චක්‍රීය ණය නිකුත් කිරීමට ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී, බැංකු විසින් ඉල්ලීම් කර, එම දිස්ත්‍රික්කයේ මුදල් අතිරික්තයක් පවත්නා දිවිනැගුම ප්‍රජාමූල බැංකු අතර අරමුදල් මාරු කිරීමට කටයුතු කළ හැක. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තුළ ප්‍රජාමූල බැංකු අතර අරමුදල් මාරු කිරීමේදී ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන්ද , ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් පිටත බැංකු අතර අරමුදල් මාරු කිරීමේදී දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතියෙන්ද, අරමුදල් මාරු කිරීමට මින් බලය ලබා දෙමි. මේ සම්බන්ධයෙන් වන ගිණුම් ක්‍රියාවලිය අංක ස/අධි/ජී/සං//7/දිවිනැගුම හා 2013.11.06 දිනැති උපදෙස් ලිපිය මඟින් ඔබ වෙත ලබා දී ඇති අතර එම ගිණුම් ක්‍රියාවලිය මෙහිදී අනුගමනය කල යුතුය.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel- 011-2873802/2872202
Fax - 011-2889002
E-mail-dg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் ( மனிதவளம்) / Director (Human Resource)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk
**Hot Line : 0112-889007**

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance)
011-2889003
011-2887469
**Hot Line:0112-885582**

කාර්යාලය / அலுவலகம் / Office
011-2887280
**Hot Line: 011- 2887722**

3. සෑම වර්ෂයක් අවසානයේම එක් එක් දිස්ත්‍රික්කයේ ජීවනෝපාය චක්‍රීය අරමුදලේ දිස්ත්‍රික් මට්ටමින් පවත්නා සමස්ථ මුදල් ශේෂයේ වටිනාකමින් 75% ක ප්‍රතිශතයක් ඊළඟ වසරේ ණය ලෙස නිකුත් කිරීම අවශ්‍ය වේ.

4. යම් දිස්ත්‍රික්කයක් ජීවනෝපාය චක්‍රීය අරමුදලේ පවත්නා සමස්ථ මුදල් ශේෂයේ වටිනාකමින් 75% ක ප්‍රමාණයකට ණය නිකුත් කිරීමට අපොහොසත් වූවහොත් , එම දිස්ත්‍රිකකයේ ජීවනෝපාය චක්‍රීය අරමුදලින් 75% දක්වා වන ප්‍රමාණයට සරිලන මුදලක් ප්‍රධාන කාර්යාලය වෙත ලබා ගෙන, අවශ්‍යතාවය පරිදි 75% ට වඩා ණය නිකුත් කර ඇති /ණය නිකුත් කල හැකි දිස්ත්‍රික්ක සඳහා ණය ලබා දීමට අවශ්‍ය ප්‍රතිමුල්‍ය පහසුකම් සැපයීමට කටයුතු කරනු ඇත.

5. දැනට බල පවත්වන වාර්ෂික පොලී අනුපාතය 5% සිට 12% දක්වා ඉහළ නංවන අතර , හීනවන ශේෂ ක්‍රමයට පොලිය ගණනය කල යුතුය.

6. එක් එක් ණයකරුගෙන් ණය වාරික හා පොලී ආදායම රැස් කිරීමේදී , පහත පරිදි පොලිය හා වාරික සඳහා ගිණුම් සටහන් තැබිය යුතුය.

හර - **සාමාජික තැන්පත් ගිණුම**

බැර - **ලැබිය යුතු ණය-ජීවනෝපාය සංවර්ධන චක්‍රීය ණය ගිණුම (වාරික මුදල)**

බැර - **ජීවනෝපාය සංවර්ධන චක්‍රීය අරමුදල් ගිණුම( පොලී ප්‍රතිශතයෙන් 7% ක ප්‍රතිශතයක්)**

බැර - **ලද පොලිය - දුන් ණය ගිණුම (පොලී ප්‍රතිශතයෙන් 5% ක ප්‍රතිශතයක්)**

7. ප්‍රමාද කරන ණය වාරික සඳහා අය කරන දඩ මුදල ද ජීවනෝපාය සංවර්ධන චක්‍රීය අරමුදලට බැර කළ යුතුය.

**ඇප සුරැකුම් හා ආපසු ගෙවීමේ උපරිම කාලය පහත දැක්වෙන පරිදි වේ.**

| **ණය මුදල රු.** | **ඉදිරිපත් කල යුතු ඇප** | **ණය අය කරන උපරිම වාරික ගණන** | **සහන කාලය** |
|---|---|---|---|
| 100,000 ට අඩු | කුඩා කණ්ඩායම් ඇප. | මාස 48 | මාස 03 |
| 100,001-250,000 දක්වා | කුඩා කණ්ඩායම් හා රාජ්‍ය / අර්ධ රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් දෙදෙනෙකුගේ ඇප හෝ දේපල ඇප.<br>ඇප ඉදිරිපත් කරන නිලධාරීන්ගේ සේවා කාලය (විශ්‍රාම යාමට පෙරාතුව ) ඇප අත්සන් කරන දින සිට ඉදිරියට තවදුරටත් අවම වශයෙන් වර්ෂ 05 ක් හෝ ඊට වැඩි විය යුතුය. දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ඇප ලෙස ඉදිරිපත් විය නොහැක. | මාස 60 | |
| 250,001-500,000 දක්වා | කුඩා කණ්ඩායම් ඇප හා දේපල ඇප. | මාස 72 | |

8. පහත ජීවනෝපාය ක්ෂේත්‍රයන් මූලික කර ගනිමින් ජීවනෝපාය චක්‍රීය අරමුදලින් ණය නිදහස් කිරීමට දිවි නැගුම ප්‍රජාමූල බැංකු වලට හැකියාව ඇත.

- කෘෂි , සත්ත්ව පාලන , ධීවර , සුළු පරිමාණ කර්මාන්ත හා ව්‍යාවසාය සංවර්ධන ව්‍යාපෘති, අලෙවි හා සේවා යන අංශ ඉලක්ක කර ගත් නව ව්‍යාපෘති හෝ දැනටමත් පවත්නා ව්‍යාපෘති බල ගැන්වීම.
- රැකියා ඉලක්ක කර ගත් වෘත්තීය පුහුණු වැඩසටහන්.
- ජීවනෝපාය ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන්ට ලබා දෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන වලට අමතරව අවශ්‍ය ප්‍රතිලාභී දායකත්වය වෙනුවෙන් ණය මුදලක් ලබා දීම.

**9. පොදු උපදෙස් හා අනෙකුත් කරුණු**

1. ලබා ගත් ණය මුදලක් තවදුරටත් අය වෙමින් පැවතියද, බැංකු කළමණාකරු ව්‍යාපෘතිය පිළිබඳ සෑහිමකට පත් වේ නම් එම සාමාජිකයින්ට ණය ලබා දීය හැක. එහිදී ණය මුදල ගෙවීමට ඇති හැකියාව පිළිබඳව සෑහිමකට පත්විය යුතුය.

2. ණය ලබා දීමේදී මෙම සංශෝධනයන්ට අදාළ වන පරිදි දිවිනැගුම ප්‍රජාමූල බැංකු වැඩසටහනේ සමස්ථ ක්‍රියාත්මක ක්‍රමවේදය අනුගමනය කරමින් ප්‍රතිලාභීන් හඳුනාගැනීම , ණය නිර්දේශය හා අනුමත කිරීම, ණය නිදහස් කිරීම හා නිසි කලට ණය අය කිරීම ආදිය කළ යුතුවේ .

3. මෙම සංශෝධන 2017.03.15 දින සිට ජීවනෝපාය චක්‍රීය අරමුදලින් ක්‍රියාත්මක සියළුම ණය සඳහා ක්‍රියාත්මක වන අතර මෙදිනට පෙර අනුමත කර ඇති ණය සඳහා මෙම සංශෝධනයන් අදාළ නොවනු ඇත.

4. ලබා ගත් ණය මුදල ණය අයදුම්පත්‍රයේ සඳහන් ව්‍යාපෘති අවශ්‍යතාවය සඳහාම වැය කර ඇත්ද යන්න පිළිබඳව පසු විපරම් කිරීම වසමේ දිවි නැගුම සංවර්ධන නිලධාරි , බැංකු කළමණාකරු, ව්‍යාපෘති කළමණාකරු , මූලස්ථාන කළමණාකරු හා ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුගේ මූලික වගකීමක් වන අතර එය පාලක මණ්ඩලයේ ද වගකීමකි. තවද ගම්මාන සමිති රැස්වීම්වලදී මෙම ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතිය සාකච්ඡා කිරීමද අවශ්‍ය වේ.

5. ණය ලබා දීමේදී කිසිවිටෙකත් පිටහිටි ශේෂය, ජීවනෝපාය චක්‍රීය අරමුදල් ගිණුමේ ශේෂය ඉක්මවා යා නොහැක. එසේම පිටහිටි ශේෂය හා බැංකුවේ ණය ලබා දීය හැකි ශේෂයේ එකතුව සෑමවිටම ජීවනෝපාය චක්‍රීය අරමුදල් ගිණුමේ ශේෂයට සමාන විය යුතුය.

6. දැනට දිවිනැගුම ප්‍රජාමූල බැංකු වැඩසටහනේ ක්‍රියාත්මක ණය සංරක්ෂණ වැඩසටහන, දී ඇති උපදෙස් පරිදි මෙම වැඩසටහනේදී ද යොදා ගත යුතුය.

7. බැංකු මට්ටමින් ජීවනෝපාය චක්‍රීය අරමුදල් ප්‍රගතිය නියමිත දිනට පෙර ප්‍රාදේශීය කාර්යාලය වෙත ලබා දීම ප්‍රජාමූල බැංකු කළමණාකරුගේ වගකීමක් වන අතර එම දත්ත නිවැරදි බවට නිර්දේශ කර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දීම මූලස්ථාන

කළමණාකරුගේ වගකීමකි. ඒ අනුව දිවිනැගුම ප්‍රජාමූල බැංකු මට්ටමින් ලබා දී ඇති තොරතුරු වල සාරාංශ වාර්තාව (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්) දිස්ත්‍රික් දිවි නැගුම අධ්‍යක්ෂගේ අත්සනින් යුතුව ප්‍රධාන කාර්යාලයට ලබාදීම දිස්ත්‍රික් කළමණාකරුගේ වගකීමකි.

8. ජීවනෝපාය චක්‍රීය අරමුදලින් ක්‍රියාත්මක ජීවනෝපාය ව්‍යාපෘති පිළිබඳ දත්ත/තොරතුරු ලබාදීමට මේ වනවිටත් ඔබ භාවිතා කරන ආකෘති පත්‍රය යොදා ගත යුතු අතර, අරමුදලේ සමස්ථ වත්කම් පිළිබඳ දත්ත/තොරතුරු මේ සමග අමුණා ඇති ආකෘති පත්‍ර 01 මගින් ලබා ගත යුතුය. එසේ ලබා ගත් දත්ත/තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සාරාංශ කර දිස්ත්‍රික් වාර්තාව සකස් කර ප්‍රධාන කාර්යාලයට ලබා දිය යුතුවේ.

9. එසේම 2016.12.31 දිනට අදාල වන දත්ත/තොරතුරු (අමුණා ඇති ආකෘති පත්‍ර 1 හා 2 මඟින්) 2017.03.15 දිනට ප්‍රථම ප්‍රධාන කාර්යාලය වෙත ලබා දීම අවශ්‍යවේ.

10. 2015 වසරේ නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධන චක්‍රීය ණය වැඩසටහන (චක්‍රලේඛ අංක 2015//11 හා 2015.09.01දිනැති ) සඳහා **<u>ප්‍රතිපාදන ලද දිස්ත්‍රික්කයන්</u>** හී ප්‍රගතිය ද මෙයට ඇතුලත් කල යුතුය. එහෙත් මෙම වැඩසටහන පිළිබඳ දත්ත/තොරතුරු අවශ්‍ය අවස්ථාවකදී වෙන් කර ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක් ඔබ විසින් සකසා ගත යුතුවේ.

11. එසේම මාසික ප්‍රගතිය ඉහතින් දැක්වූ පරිදි අදාළ ආකෘති පත්‍ර මඟින් සෑම මසකම නියමිත දිනට ප්‍රථම ප්‍රධාන කාර්යාලය වෙත ලබා දීම අවශ්‍ය වන බවද කාරුණිකව දන්වමි.

වාර්ෂිකව ලබා දෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන වලට අමතරව ජීවනෝපාය චක්‍රීය අරමුදල් යොදවා ජීවනෝපාය ව්‍යාපෘති ආරම්භ කිරිම හා සාර්ථකව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කිරීමටද, අදාල ප්‍රගති වාර්තා නිවැරදිව , නියමිත දිනට ලබා දීමට ද ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරනු ඇතැයි අපේක්ෂා කරන අතර එය ඉතා අගය කොට සලකමි.

නීල් බණ්ඩාර හපුහින්න
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1.සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කා.දැ.ගැ.ස හා අ.ක.ස.
2.ප්‍රධාන ගණකාධිකාරී,දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක ,දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
4.සියළුම අංශ ප්‍රධානීන්,දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
5.සියළුම දිවි නැගුම මූලස්ථාන කළමණාකරුවන්

අ.ක.ස. හා මහා සංගම් කළමණාකාර අධ්‍යක්ෂවරුන්, ව්‍යාපෘති කළමණාකරුවන්, ප්‍රජා මූල බැංකු කළමණාකරුවන් හා දිවිනැගුම සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා